සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

63630

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

23 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

දේශපාලන විද්‍යාවේ මූලිකාංග I
அரசியல் மூலத்துவங்கள் I
Elements of Political Science I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

විභාග අංකය : .......................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

- ※ **I** කොටසේ බහුවරණ ප්‍රශ්න **40**ක් ඇත.
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. එක් නිවැරදි පිළිතුරකට **ලකුණු එක** බැගින් හිමි වේ.
- ※ **I** කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, එය **II** කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දිය යුතු ය.
- ※ එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර **තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**
- ※ පිළිතුරු ලකුණු කිරීම සඳහා පැන්සල් භාවිත කිරීම තහනම් වේ.

## I කොටස

- අංක **1** සිට **4** තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ නො වේ. අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.

1. දේශපාලනය හදරන අධ්‍යයන විෂය ධාරාව හඳුන්වනු ලබන්නේ
   (1) දේශපාලනය යනුවෙනි.
   (2) දේශපාලන විද්‍යාව යනුවෙනි.
   (3) දේශපාලනය පිළිබඳ විද්‍යාව යනුවෙනි.
   (4) චර්යාවාදී විද්‍යාව යනුවෙනි. (.........)

2. දේශපාලනය යන යෙදුම
   (1) පළමුව යොදගනු ලැබුයේ මැකියාවලි විසිනි.
   (2) එය පිළිබඳව හදරන අධ්‍යයන විෂයය සඳහා පොදුවේ යොදන නාමයයි.
   (3) 'පොලිස්' නම් ග්‍රීක වචනයෙන් බිඳී පැමිණ ඇත.
   (4) සාමාන්‍ය වහරේදී දේශපාලන පක්ෂ හා දේශපාලකයන් යන තත්ත්වයන් හඳුනාගැනීමට යොදගනු ලැබේ. (.........)

3. දේශපාලන විෂයයේ අත්‍යවශ්‍ය අංගයන් වන්නේ
   (1) අපරාධ නීතිය
   (2) ජාතීන් අතර දේශපාලනය
   (3) ඡන්දදායක චර්යාව
   (4) දේශපාලනය පිළිබඳ න්‍යායයන් (.........)

4. දේශපාලනය හැදරීම ප්‍රයෝජනවත් වන්නේ
   (1) ආණ්ඩුක්‍රම පිළිබඳ වටහා ගැනීම පුළුල් කර ගැනීමට ය.
   (2) පුරවැසියන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම්වල වැදගත්කම වටහා ගැනීමට ය.
   (3) පොදු ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහිත පුරවැසියන් නිර්මාණය කිරීමට ය.
   (4) ආගමික සවිඥානකත්වය පුරවැසියන් තුළ ප්‍රවර්ධනය කිරීමට ය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

● පහත සඳහන්වන දේශපාලන විද්‍යාව හැදෑරීම සඳහා වන ප්‍රවේශයන්ට අදළ ප්‍රකාශ යොදගෙන ප්‍රශ්න අංක **5** සහ **6** ට පිළිතුරු දෙන්න.

ප්‍රකාශය :
(1) ප්‍රත්‍යක්ෂමූලකවාදය පදනම් කරගෙන දේශපාලනය හැදෑරීම
(2) සමාජය පිළිබඳ ගැඹුරු වටහාගැනීමක් තුළින් දේශපාලනය හැදෑරීම
(3) විවිධ ආණ්ඩුක්‍රම සැසඳීම මගින් දේශපාලනය හැදෑරීම
(4) දේශපාලනයේ සත්‍ය ලෙස සිදුවන්නේ කුමක්ද නොව එය තුළ තිබිය යුත්තේ කුමක්දැයි සලකා බැලීම

5. **සමාජ විද්‍යා ප්‍රවේශයට** අදළවන ප්‍රකාශය හඳුන්වා දෙන්න. (.........)

6. **දර්ශනික ප්‍රවේශයට** අදළවන ප්‍රකාශය හඳුන්වා දෙන්න. (.........)

● ප්‍රශ්න අංක **7** සිට **10** තෙක් දී ඇති ප්‍රකාශ හතරෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදළ නැත. අදළ **නැති** ප්‍රකාශය තෝරන්න.

7. ජාතික රාජ්‍ය ක්‍රමය පැන නැගීමට දයකවූ සාධක වන්නේ
(1) පුනරුද සහ රෙපරමාදු ප්‍රතිසංස්කරණ ව්‍යාපාර
(2) වැඩවසම් ක්‍රමය බිඳ වැටීම
(3) 16 වන සියවසේ දී යුරෝපයේ පැතිර ගිය ප්‍රජාතන්ත්‍රවාදී ඇගයුම්
(4) යුරෝපය පුරා පැතුරුණු ජාතිකත්ව සංවේදිතා (.........)

8. රාජ්‍යය යනු
(1) අනිකුත් සංවිධාන අතර සුවිශේෂ සංවිධානයකි.
(2) ආණ්ඩුවේ උපකරණයකි.
(3) අත්‍යවශ්‍ය සහ විශ්වීය ආයතනයකි.
(4) ස්වාධිපති බලයේ තනි අයිතිකරුය. (.........)

9. ආණ්ඩුව යනු
(1) ප්‍රජාවකට අයත් පාලන ආයතනයකි.
(2) රාජ්‍යයක් පාලනය කරන එක් පුද්ගලයකු හෝ පුද්ගල කණ්ඩායමකි.
(3) රාජ්‍යය සතු ස්වාධිපත්‍යය පාවිච්චිකරන සංවිධානයකි.
(4) පුරවැසියන් මත මර්දනකාරී බලය යොදවන සංවිධානයකි. (.........)

10. සමාජය
(1) පොදු සහ නිශ්චිත සංස්කෘතියක් ඇති ජන කාණ්ඩයකි.
(2) කෘත්‍රිම වූ නිර්මාණයකි.
(3) රාජ්‍යයට පූර්වයෙන් පැවතිණ.
(4) බහුවිධ කෘත්‍යයන් ඉටුකරයි. (.........)

● අංක **11** සිට **18** තෙක් ඇති ප්‍රශ්නවල ලබා දී ඇති ප්‍රකාශ හතරෙන් තුනක් ප්‍රශ්නයේ මාතෘකාවට අදළ ය. අදළ **ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

11. රාජ්‍යය පිළිබඳ දේවවරම්වාදී න්‍යායට අනුව
(A) පාලකයන් වග වියයුත්තේ දෙවියන්ට පමණි.
(B) නපුරු රජකුට දඬුවම් පමුණුවන්නේ දෙවියන් පමණි.
(C) ආධිපත්‍යය දේව නිර්මාණයකි.
(D) ප්‍රකෘති සමාජයේදී රාජ්‍යය පැන නැගුණි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

12. සමාජ සම්මුති න්‍යායට අනුව
(A) මානව වර්ගයාගේ ආරම්භක තත්ත්වය පැවතියේ ප්‍රකෘති සමාජයක ය.
(B) ප්‍රකෘති සමාජය පාලනය කළේ දෙවියන් වහන්සේ ය.
(C) ජනයා විසින් ඇතිකරගන්නා ලද සම්මුතියකින් ප්‍රකෘති සමාජය අවසන් කරන ලදී.
(D) දේශපාලන අධිකාරිය මහජන අනුමැතිය මත පදනම් වේ.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

13. රාජ්‍යය පිළිබඳ විකාශනාත්මක න්‍යාය
(A) ඓතිහාසික න්‍යාය යනුවෙන් හඳුන්වනු ලැබේ.
(B) මානව විද්‍යාව සහ ඉතිහාස විද්‍යාව මත පදනම්ව ඇත.
(C) රාජ්‍යය නිර්මාණයක් නොව වර්ධනයක් බව අවධාරණය කරයි.
(D) රාජ්‍යය පීතෘමූලික පවුල් ක්‍රමයේම හුදු ව්‍යාප්තියක් වශයෙන් හඳුනා ගනියි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

14. රාජ්‍යය පිළිබඳ මාක්ස්වාදී න්‍යායට අනුව
(A) සමාජ ජීවිතයේ ප්‍රාථමික අවධියේ දී රාජ්‍යය නොපැවතුණි.
(B) සමාජය දේපල හිමි සහ දේපල අහිමි යනුවෙන් පංතීන්වලට බෙදීම සමග රාජ්‍යය පැනනැගුණි.
(C) නිර්ධන පංතියට සේවය කිරීම සඳහා රාජ්‍යය අවශ්‍යවෙයි.
(D) පංති විරහිත සමාජයකදී රාජ්‍යය තවදුරටත් පවතින්නේ නැත.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

15. රාජ්‍යය පිළිබඳ ෆැසිස්ට් න්‍යාය
(A) නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම අවධාරණය කරයි.
(B) ජාතීන්ගේ වාර්ගික උත්තරීතරත්වය සඳහා තර්ක කරයි.
(C) නායකයාට පූජනීයත්වයක් ප්‍රදානය කරයි.
(D) දේපළ පිළිබඳ පෞද්ගලික අයිතිය පිළිගනියි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

16. ලිබරල් න්‍යායට අනුව
(A) රාජ්‍යය සමාජ සංවිධානයකි.
(B) සමාජයීය සමතාවය සහ පුද්ගල නිදහස රාජ්‍යය විසින් පිළිගනියි.
(C) රාජ්‍යය ස්ථාවර පැවැත්මකි.
(D) රාජ්‍යය සමාජ ප්‍රභූ කණ්ඩායම සතු උපකරණයකි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

17. බලය
(A) එක්තරා අන්දමක මානව සම්බන්ධතාවයකි.
(B) තවත් අයකුගේ චර්යාවට බලපෑනු ලබන මාධ්‍යයකි.
(C) ප්‍රචණ්ඩත්වය යොදවාගෙන ක්‍රියාවට නගන විට අස්ථාවරය.
(D) පවතින්නේ එය හොබවන පුද්ගලයාට මිස තනතුරට නොවේ.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

18. ස්වාධිපත්‍යය
(A) රාජ්‍යයේ කැපී පෙනෙන ලක්ෂණයයි.
(B) බාහිර සහ අභ්‍යන්තර වශයෙන් පැතිකඩයන් දෙකක් ඇත.
(C) පරමය, සුවිශේෂීය, නොබිඳිය හැකිය සහ පැවරිය හැකිය.
(D) අන්‍ය සංවිධාන, රාජ්‍යයෙන් වෙන් කර දක්වයි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

- අංක **19** සහ අංක **20** යන ප්‍රශ්නවලට **නීතියේ ස්වභාවය** පිළිබඳ පහත සඳහන් ප්‍රකාශන පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

(1) සමාජය තුළ ආධිපත්‍යය හිමිකර ගෙන සිටින අධිකාරය විසින් පනවා තිබෙන හැසිරීම පිළිබඳ නියමයකි.
(2) නීතිය හුදෙක් අධිපති පංතියේ ආසාවන් ප්‍රකාශයට පත් කිරීමකි.
(3) මර්දනකාරී තහංචි දමීමක් මගින් ශක්තිය සපයා ඇති නියමයන් පිළිබඳ ක්‍රමයකි.
(4) සමාජයීය අවශ්‍යතා තුළින් පැනනගින්නාවූ භාවිතයක් හෝ නියමයක් සඳහා නීතිමය වටිනාකමක් සපයාදීමකි.

19. නීතියේ ස්වභාවය පිළිබඳ **මාක්ස්වාදී මතයට** අදළ ප්‍රකාශය තෝරන්න. (.........)

20. නීතියේ ස්වභාවය පිළිබඳ **සමාජ විද්‍යාත්මක මතයට** අදළ ප්‍රකාශය තෝරන්න. (.........)

- අංක **21** සහ අංක **30** දක්වා ඒ ඒ ප්‍රශ්නයට දී ඇති උපදෙස් අනුගමනය කරමින් පිළිතුරු සපයන්න.

21. සමානාත්මතාවයට අදළ **නොවන්නාවූ** ප්‍රකාශය තෝරන්න.
(1) සියළු දෙනාට ප්‍රමාණවත් අවස්ථාලාභයන් සලසා දීම
(2) සමානාත්මතාවය පිළිබඳ අදහස අත්‍යවශ්‍යයෙන්ම නිදහස පූරණය කරයි.
(3) ටික දෙනකු අත ආර්ථික බලය ඒකරාශී නොකිරීම
(4) පුරවැසියන් අතර කිසිදු ආකාරයක වෙනස්කම් නොතිබීම (.........)

22. නිදහස සමග සම්බන්ධ නැති **වැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) අවශ්‍යයෙන්ම සිදු කළ යුතුව තිබෙන දෙය සිදු කිරීමට ඇති අයිතිය
(2) සීමාවන් හා බාධකයන් නොමැතිකම සමග හඳුනාගනු ලබයි.
(3) හොඳ කම පිළිබඳ සම්මතයට සාපේක්ෂව එක් එක් පුද්ගලයාට හිමි නිදහස සලකා බැලිය යුතු ය.
(4) පුද්ගලයාගේ නිදහස හා රාජ්‍යයේ අධිකාරය එකිනෙකට ප්‍රතිකූල වෙයි. (.........)

23. පහත සඳහන් අයිතිවාසිකම්වලින් සිවිල් අයිතිවාසිකම් වලට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   A - පුද්ගල නිදහසට ඇති අයිතිය
   B - වැටුප් සඳහා සාමූහික කේවල් කිරීමට ඇති අයිතිය
   C - වැඩ කිරීමට ඇති අයිතිය
   D - සමාජ සංරක්ෂණයට ඇති අයිතිය
   E - ආගම ඇදහීමට ඇති අයිතිය
   F - කථාකිරීමට හා අදහස් ප්‍රකාශ කිරීමට ඇති අයිතිය
   (1) ACB (2) AEF (3) ABD (4) ADF (.........)

24. ඩයිසිගේ නීතියේ ආධිපත්‍ය සංකල්පයට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.
   (1) සෑම පුද්ගලයකුම රටේ සාමාන්‍ය නීතිය මගින් පාලනය විය යුතු ය.
   (2) නිශ්චිත නීති කඩකිරීමකදී මිස දඬුවමකට භාජනය නොවිය යුතු ය.
   (3) පරිපාලනය හා සම්බන්ධ වැරදි විමර්ශනයට වෙනම උසාවි තිබිය යුතු ය.
   (4) සියල්ලන් නීතිය ඉදිරියේ සමානය. (.........)

25. දේශපාලන පක්ෂවලට අදාළ නැති ප්‍රකාශය තෝරන්න.
   (1) රටේ පවතින ආසාවන් තෝරාගෙන ඒවායේ සමුච්චිතය ගොඩ නංවයි.
   (2) ආරක්ෂණය හා ප්‍රවර්ධනය පිළිබඳ සංවිධානයක් වශයෙන් වර්ග කර ඇත.
   (3) දේශපාලන හා ආර්ථික න්‍යායවාද මගින් එකිනෙකින් වෙනස් වෙයි.
   (4) නායකයන් බඳවා ගැනීම හා පුහුණු කිරීම පිළිබඳ ඒජන්තයකු ලෙස කටයුතු කරයි. (.........)

26. මහජන මතය සඳහා වඩාත් ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   A - එයට අතීතයක් හෝ අනාගතයක් නැත.
   B - ඒකාධිපති ආණ්ඩුවක් යටතේ එය සම්පූර්ණයෙන් ම හැකිලීයයි.
   C - ජනතා මනස පාලනය කිරීමට ආණ්ඩුවට යොද ගත හැකි මාධ්‍යයකි.
   D - පොදු ගැටලු පිළිබඳ මහජන ආකල්ප ඒමගින් පෙන්වා දෙයි.
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

- ප්‍රධාන නියෝජන ක්‍රම දෙකට සම්බන්ධ සමහර ලක්ෂණ පහතින් දී ඇත. අංක **27** සිට **28** යන ප්‍රශ්නවලට මෙම ප්‍රකාශ යොදගෙන පිළිතුරු සපයන්න.
   A - මැතිවරණයක දී දෙන සෑම ඡන්දයකට ම සමාන වටිනාකමක් සපයයි.
   B - බහු පක්ෂ ක්‍රමයේ වර්ධනය ධෛර්යමත් කරයි.
   C - කුඩා පක්ෂ පැමිණීමට විරුද්ධ ය.
   D - දේශපාලන පක්ෂවලට නියෝජනය ලබාදීම යන අදහස මත පදනම්ව පවතී.
   E - පක්ෂ නායකයන්ගේ තත්ත්වය ශක්තිමත් කරයි.
   F - භූමිය නියෝජනය කිරීමේ අදහස මත පදනම්ව පවතී.

27. බහුතර ක්‍රමයට ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   (1) ABC (2) ACF (3) ADF (4) ACE (.........)

28. සමානුපාතික නියෝජනයට ගැළපෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   (1) BDE (2) ABD (3) BDF (4) DEF (.........)

29. ජනමත විචාරණයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
   (A) ජනයාගේ නියෝජිතයන් තෝරාගැනීමේ තවත් මාධ්‍යයක් ලෙස සලකනු ලැබේ.
   (B) නීතිය පැනවීමට ජනයා කෙළින්ම සහභාගි වීමකි.
   (C) එය නීති පැනවීමේ දී ජනයාට නිෂේධ බලය ලබාදීමකි.
   (D) එය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීමට ඇති පළිහකි.
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

30. අධිකරණයට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.
   (1) එය ආණ්ඩුවේ තුන්වන හා ස්වාධීනව පැවතිය යුතු අංශයයි.
   (2) රාජ්‍ය නීතිය අර්ථ නිරූපණය කිරීම හා බලාත්මක කිරීම සිදු කරයි.
   (3) නීතිය අර්ථ නිරූපණය කිරීම මගින් එය නව නීති නිර්මාණය කරයි.
   (4) එය යල් පිනූ නීති නිෂේධනය කරයි. (.........)

● අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) යන කවර හැඳින්වීම දැ'යි සඳහන් කරන්න.

**අංක 1 වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| (1) | සත්‍ය ය. | සත්‍ය ය. |
| (2) | සත්‍ය ය. | අසත්‍ය ය. |
| (3) | අසත්‍ය ය. | සත්‍ය ය. |
| (4) | අසත්‍ය ය. | අසත්‍ය ය. |

**වගුව 1**

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 31. | එක්සත් රාජධානිය තුළ උත්තරීතර නීති පනවන්නා වන්නේ වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තුව ය. | කිසිම පුද්ගලයකුට හෝ ආයතනයකට වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තුව පැනවූ නීතියක් ඉක්මවා යාම කළ නොහැක. (.........) |
| 32. | බ්‍රිතාන්‍ය රජින ජීවිතකාලයට පත්කරගෙන සිටින නාමික විධායක වන්නේය. | රාජ්‍ය නායකයා ලෙස සිදුකරන විධායක කෘත්‍යයන් සඳහා බ්‍රිතාන්‍ය රජින වගකියන්නේ නැත. (.........) |
| 33. | ප්‍රාන්ත රාජ්‍යයක වැඩිම ඡන්ද ලබාගන්නා ජනාධිපති අපේක්ෂකයා ඡන්ද විද්‍යාලය තුළ එම ප්‍රාන්තයට හිමි සියලු ඡන්ද ලබා ගැනීම ඇමෙරිකා ජනාධිපති වරණයේදී සිදුවෙයි. | කිසිදු අපේක්ෂකයකුට ඡන්ද විද්‍යාලයේ බහුතර ඡන්දය ලබා ගත නොහැකි වුවහොත් ජනාධිපති තේරීමේ වගකීම සෙනට් සභාවට පැවරෙයි. (.........) |
| 34. | ඇමෙරිකානු ජනාධිපතිවරයා තනතුරෙන් පහකිරීමට දෝෂාභියෝගයක් සෙනට් සභාවේ 2/3 ක ඡන්දයෙන් අනුමත කළ යුතු ය. | ඇමෙරිකානු කොන්ග්‍රසයේ මන්ත්‍රීවරු පහකිරීමට ද දෝෂාභියෝග ක්‍රමය යොදා ගනු ලබයි. (.........) |
| 35. | ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට ජාතික සභාවට පිටස්තර පුද්ගලයන් හා ශිල්ප තාන්ත්‍රිකයන් ඇමතිවරු ලෙස පත් කළ හැක. | ප්‍රංශ ජාතික සභාවේ මන්ත්‍රීවරයකු ඇමතිවරයකු ලෙස පත්කළහොත් ඔහු/ඇය එම සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය යුතු ය. (.........) |
| 36. | ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දේශපාලන පක්ෂ දෙකකින් පැමිණෙන ජනාධිපතිවරයකු සහ අගමැතිවරයකු අතර සහහැසිරීමේ ආණ්ඩුවක් සඳහා පහසුකම් සලසා ඇත. | සහහැසිරීමේ කාලයේදී අගමැතිවරයාට ජනාධිපතිවරයාව බලයෙන් පහ කිරීමට පුළුවන. (.........) |
| 37. | සුප්‍රිම් සෝවියට් සභාවේ සැසිවාර දෙකක් අතර ඉහළ නීති පැනවීමේ ආයතනය සේ පැරණි සෝවියට් සංගමයේ ප්‍රිසීඩියම ක්‍රියා කළේ ය. | සෝවියට් ප්‍රිසීඩියම නීති පැනවීම හා විධායක බලය යන කෘත්‍යයන් දෙකම භුක්ති වින්දේය. (.........) |
| 38. | පැවති සෝවියට් දේශයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රාජ්‍ය බලය පිළිබඳ ඒකාධිකාරය කොමියුනිස්ට් පක්ෂයට සහතික කළේ ය. | සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය වැඩ කරන පංතියේ පෙරමුණු බලඇණිය වශයෙන් හැඳින්වූ අතර තනි නායකයකු විසින් මෙහෙයවන ලදී. (.........) |
| 39. | ඉන්දියානු ආණ්ඩුක්‍රමය ඒකීය, සන්ධීය, කැබිනට් සහ ජනාධිපති යන ආණ්ඩුක්‍රමවල මනා සංකලනයකි. | සන්ධීය ආණ්ඩුක්‍රමයක් තුළ කැබිනට් ආණ්ඩුක්‍රමයක් ක්‍රියාවට නැගීම සම්බන්ධයෙන් ඉන්දියාව මනා උදාහරණයක් සපයයි. (.........) |
| 40. | ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉන්දියාව සන්ධීය ආණ්ඩුක්‍රමයක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. | ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය යෝජනාවක් සම්මත කර ඉල්ලා සිටියහොත් ඕනෑම ප්‍රාන්තයකට සංගමික රාජ්‍යයෙන් ඉවත්ව යා හැකි ය. (.........) |

* *

63642



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

23 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

දේශපාලන විද්‍යාවේ මූලිකාංග I (II කොටස)
அரசியல் மூலத்துவங்கள் I (பகுதி II)
Elements of Political Science I (Part II)

**අයදුම්කරුවන්ට උපදෙස් :**

※ ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **15**කි.
※ ප්‍රශ්න කොටස්වලට බෙදා ඇති විට ලකුණු කොටස් අතර සමාන ව බෙදේ.

1. පහත සඳහන් මාතෘකා යටතේ දේශපාලන විද්‍යාවේ ස්වභාවය විමසන්න.
   (i) රාජ්‍යය සහ බලය පිළිබඳ හැදෑරීමකි.
   (ii) තම හැදෑරීම් සඳහා විද්‍යාත්මක ක්‍රමවේද යොදා ගනියි.
   (iii) සමාජයීය විද්‍යාවකි.

2. පහත සඳහන් ඒවා කෙටියෙන් විමසන්න.
   (i) රාජ්‍යය සහ සමාජය
   (ii) රාජ්‍යය සහ ආණ්ඩුව
   (iii) රාජ්‍යය සහ අන්‍ය සංවිධාන

3. පහත සඳහන් න්‍යායන් යටතේ රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණ හඳුන්වා දෙන්න.
   (i) ලිබරල් න්‍යාය
   (ii) මාක්ස්වාදී න්‍යාය
   (iii) ෆැසිස්ට්වාදී න්‍යාය

4. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යකරණයට අදාළවන පරිදි පහත සඳහන් කාරණාවන් විස්තර කරන්න.
   (i) අයිතිවාසිකම්
   (ii) යුතුකම්
   (iii) අයිතිවාසිකම් ආරක්ෂණ යාන්ත්‍රණ

5. "නූතන ආණ්ඩුක්‍රමයන්හි විධායකය ආධිපත්‍ය ස්ථානයක් හිමි කර ගෙන සිටී." අදහස් දක්වන්න.

6. පහත සඳහන් ඒවායින් ඕනෑම **එකක්** ගැන විමසන්න.
   (i) ඇමෙරිකානු ජනාධිපතිවරයාගේ සහ බ්‍රිතාන්‍ය අගමැතිවරයාගේ බලතල සහ කෘත්‍යයන්
   (ii) ප්‍රංශයේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර සම්බන්ධතාවය
   (iii) ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒකීය සහ සන්ධීය ලක්ෂණ

7. පහත දක්වෙන ඒවායින් ඕනෑ ම **තුනක්** ගැන කෙටි සටහන් ලියන්න.
   (i) නූතන රාජ්‍යය තුළ දේශපාලන පක්ෂ සතු කෘත්‍යයන්
   (ii) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල නියෝජන ක්‍රමයේ වැදගත්කම
   (iii) නීති පිළිබඳ අධිකරණ ප්‍රතිනිරීක්ෂණයේ වැදගත්කම
   (iv) දේශපාලන සමාජානුයෝජනය
   (v) ද්වි මණ්ඩලවාදයට පක්ෂව සහ විපක්ෂව ඇති තර්ක

※※※

AL/2010/23-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

63647

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

23 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

දේශපාලන විද්‍යාවේ මූලිකාංග II
அரசியல் மூலத்துவங்கள் II
Elements of Political Science II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ........................

**අයදුම්කරුවන්ට උපදෙස් :**

- ❊ I කොටසේ බහුවරණ ප්‍රශ්න 40ක් ඇත.
- ❊ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. එක් නිවැරදි පිළිතුරකට **ලකුණු එක** බැගින් හිමි වේ.
- ❊ I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා, එය II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දිය යුතු ය.
- ❊ එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි පිළිතුර **තෝරා රව අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**
- ❊ පිළිතුරු ලකුණු කිරීම සඳහා පැන්සල් භාවිත කිරීම තහනම් වේ.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් එක් ප්‍රකාශයක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ නො වේ. අදාළ **නොවන** ප්‍රකාශය තෝරන්න.

1. බ්‍රිතාන්‍ය යටත්විජිත කාලපරිච්ඡේදයේ දී
   (1) ශ්‍රී ලංකාව නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් බවට පත්විය.
   (2) නිදහස් වෙළෙඳපොළ ක්‍රමයක් සඳහා පැවති සියලු සීමා ඉවත්කරන ලදී.
   (3) සාම්ප්‍රදායික ඉඩම් සහ සේවා භුක්ති ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යන ලදී.
   (4) මධ්‍යම පංතියක් නිර්මාණය කිරීමට දායක වූ දේශීය ව්‍යවසායක පංතියක් පැනනැගුණි. (.........)

2. බ්‍රිතාන්‍ය යටත්විජිත කාලපරිච්ඡේදයේ දී
   (1) සාම්ප්‍රදායික සමාජයට නූතනත්ව බලවේග මුණගැසුණි.
   (2) රාජ්‍ය ප්‍රතිපත්ති මගින් මහ පෙන්විය යුතු සමාජ කෘත්‍යයක් බවට අධ්‍යාපනය පත්විය.
   (3) හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනය දේශීය සමාජයේ ධනවත් පංතීන්ට සීමා කරන ලදී.
   (4) උගත් බර්ගර්වරු සහ යුරෝපීයයන්ගෙන් සමන්විතවූ මධ්‍යම පංතියක් පැන නැගුණි. (.........)

3. කෝල්බෲක්-කැමරන් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ වූයේ
   (1) ව්‍යවස්ථාදායක හා විධායක අංශවලින් අධිකරණය වෙන් කිරීම ය.
   (2) හෙබයාස් කෝපස් නීතිය ලංකාවට හඳුන්වා දීම ය.
   (3) අධිකරණය ජනයාගේ සිවිල් අයිතිවාසිකම් පිළිබඳ තනි අධිකාරය බවට පත්කිරීම ය.
   (4) ආණ්ඩුවේ අයවැය පාලනය කිරීමේ බලය ව්‍යවස්ථාදායක සභාවට පැවරීම ය. (.........)

4. කෝල්බෲක්-කැමරන් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ වූයේ
   (1) ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම ය.
   (2) ව්‍යවස්ථාදායක සභාවට නිල නොලත් සභිකයන් ඇතුළත් කර ගැනීම ය.
   (3) යුරෝපීය ව්‍යාපාරිකයන්ගේ ආශාවන් නියෝජනය කිරීමට නිල නොලත් සභිකයන් පත්කිරීම ය.
   (4) උගත් ලාංකිකයන් සඳහා නිලනොලත් සභිකයන් පත්කිරීම ය. (.........)

5. කෝල්බෲක්- කැමරන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම
   (1) ශ්‍රී ලංකාවේ යටත්විජිත රාජ්‍යය නිර්මාණය කිරීමට මුලපිරීමක් විය.
   (2) රාජ්‍යයෙන් ආණ්ඩුව වෙන් කිරීමට මහ පැදුවේය.
   (3) සමාජය තුළ සිවිල් සහ ආර්ථික අයිතිවාසිකම් පැනනැගීමට මහ පැදුවේය.
   (4) කච්චේරි පරිපාලන ක්‍රමය අහෝසි කිරීමට වගකිව යුතු විය. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

6. යටත්විජිත ශ්‍රී ලංකාවේ මධ්‍යම පංතිය
   (1) බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී අධ්‍යාපන ක්‍රමයේ නිර්මාණයකි.
   (2) සාමාන්‍ය ජනයා දේශපාලනයට කැඳවාගෙන ආ දේශපාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ උනන්දු විය.
   (3) බටහිරකරණය වූ, උගත් සහ ධනවත් පංතිවලට අයත් පුද්ගලයන්ගෙන් සමන්විත විය.
   (4) සාමාන්‍ය ජනයා දේශපාලනයට යොමු කරනු ලැබූ සමාජ ව්‍යාපාරයන්ට නායකත්වය සැපයීය. (………)

7. 1870 ගණන්වල ආගමික පුනර්ජීවනය
   (1) ශ්‍රී ලාංකික සමාජයේ ජනවාර්ගික අනන්‍යතා සකස්කිරීමට පදනම දැමීය.
   (2) සාමාන්‍ය ජනයා අතර අධිරාජ්‍ය විරෝධය ඇති කිරීමේ ශක්‍යතාව පෙන්නුම් කළේය.
   (3) යටත්විජිත ආණ්ඩුවේ ආගමික සහ අධ්‍යාපන ප්‍රතිපත්තිවලට වක්‍ර ලෙස අභියෝග කළේය.
   (4) සුළුතර ප්‍රජාවන්ට එරෙහිව බහුතර ප්‍රජාව එක්සත් කළේය. (………)

8. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය
   (1) ශ්‍රී ලාංකික අනන්‍යතාව ප්‍රවර්ධනය කිරීම වෙනුවට ජාතිවාදී මතභේදවල බීජ වැපිරීය.
   (2) 1920 ට පසුව ජනවාර්ගික, ආගමික සහ ප්‍රාදේශීය කරුණු අනුව බෙදුණි.
   (3) මධ්‍යම පංතියේ ආශාවන් නියෝජනය කළේය.
   (4) 1930 ගණන්වලදී ජනප්‍රිය ජනතා ව්‍යාපාරයක් වශයෙන් සංවිධානය විය. (………)

9. යටත්විජිත ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරය
   (1) සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීමට උපස්ථම්භක විය.
   (2) ජාතික ව්‍යාපාරය තුළ සිටි බොහෝ රැඩිකල් නායකයන් නිර්මාණය කළේය.
   (3) 1930 ගණන්වල වාමාංශික ව්‍යාපාරය සඳහා සමාජ පසුබිම සැපයීය.
   (4) 1915 කෝලාහලයේ දී මුස්ලිම්වරුන්ට විරුද්ධව ප්‍රචණ්ඩත්වය ඇවිස්සීමට වගකිව යුතුය. (………)

10. ලංකා ජාතික සංගමය
   (1) 1917 ට පසුව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ වැඩසටහන් සංවිධානය කළ නායකයින් විසින් පිහිටුවන ලදී.
   (2) ඉන්දියානු ජාතික සංගමයේ දේශපාලන වැඩපිළිවෙළ හා සමාන වැඩ පිළිවෙළක් අනුගමනය කළේය.
   (3) ඉන්දියානු ජාතික සංගමයේ සංවිධාන ව්‍යුහයට සමාන සංවිධාන රටාවක් යොදගත්තේය.
   (4) ලංකාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ ස්වපාලන තත්ත්වය ලබා ගැනීම අපේක්ෂා කළේය. (………)

- අංක **11** සිට **20** තෙක් ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ හතරෙන් මාතෘකාවට අදාළ වන්නේ ප්‍රකාශ තුනක් පමණි. අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

11. 1911 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
   A - මැතිවරණ මූලධර්මය හඳුන්වා දීම
   B - සීමිත ඡන්දබලය හඳුන්වා දීම
   C - වාර්ගික නියෝජනය හඳුන්වා දීම
   D - උගත් ලාංකිකයන් සඳහා ආසනයක් හඳුන්වා දීම
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (………)

12. 1921 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
   A - නිල නොලත් සභිකයන් ව්‍යවස්ථාදායක සභාවේ බහුතරය බවට පත්කිරීම
   B - නිල නොලත් ව්‍යවස්ථාදායක සභිකයන් දෙදෙනෙකු විධායක සභාවට පත්කිරීම
   C - උඩරට සිංහලයන් සුළුතර ප්‍රජාවක් වශයෙන් පිළිගැනීම
   D - නිල නොලත් සභිකයන් 11 ක් සඳහා ප්‍රාදේශීයබද ඡන්ද කොට්ඨාස හඳුන්වා දීම
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (………)

13. 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
   A - ව්‍යවස්ථාදායක සභාව තුළ තෝරා පත් කරගත් බහුතරයක් නිර්මාණය කිරීම
   B - ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිවරයා එහි සාමාජිකයන් විසින් පත් කර ගැනීම
   C - ව්‍යවස්ථාදායක සභාවේ උප සභාපතිවරයා එහි සාමාජිකයන් විසින් පත්කර ගැනීම
   D - බලය සහ වගකීම එකිනෙකින් වෙන් කිරීම
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (………)

14. 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
   A - දේශීය නායකයන් විධායක පාලනයට සහභාගිවීම
   B - වාර්ගික නියෝජනයේ සිට සුළුතර නියෝජනයට මාරු වීම
   C - අධිකරණයේ සහ රාජ්‍ය සේවාවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට යෙදූ විධිවිධාන
   D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධන ක්‍රියාදාමයේ පැවති නම්‍යතාව
   (1) ABC (2) BCD (3) ACD (4) ABD (………)

[ තුන්වෙනි පිටුව බලන්න.

15. 1947/48 ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
A - අසමාන සැලකිලි නොදක්වීම පිළිබඳ විධිවිධානයක් අන්තර්ගතවීම
B - පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි ලබා දෙන ලද ප්‍රමුඛතාවය
C - පාර්ලිමේන්තුව රාජ්‍යයේ උත්තරීතර ආයතනය බවට පත්කිරීම
D - ලංකාවේ ව්‍යවස්ථානුකූල ආණ්ඩුක්‍රමය සහ බ්‍රිතාන්‍ය කිරීටය අතර පැවති සම්බන්ධය
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

16. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
A - එක්සත් රාජධානිය සමග පැවති සියලු ව්‍යවස්ථාමය සම්බන්ධතා අත්හැර දැමීම
B - ජාතික රාජ්‍ය සභාව රාජ්‍යයේ උත්තරීතර ආයතනය පවට පත් කිරීම
C - බලතල ඒකරාශීකරණය වෙනුවට බලතල බෙදීම
D - අගමැති ඒකතන්ත්‍රයක් පිහිටුවීම
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

17. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
A - දේශපාලන විධායකය විසින් නාමික විධායකය පත්කිරීම
B - රාජ්‍ය සේවා කොමිසම අහෝසි කිරීම
C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය මගින් නීති පිළිබඳ අධිකරණ ප්‍රතිනිරීක්ෂණය සිදුකිරීම
D - අධිකරණ සේවා කොමිසම අහෝසි කිරීම
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

18. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ
A - විධායක ජනාධිපති අත බලය ඒකරාශී කිරීම
B - ව්‍යවස්ථාදායකය සහ අධිකරණය විධායකයට වඩා තත්වයෙන් පහතට වැටීම
C - ජනාධිපතිට එරෙහි දෝෂාභියෝගයක් පළමුව කථානායකවරයාට ඉදිරිපත් කිරීම
D - හදිසි අවස්ථාව කාලයේදී පාර්ලිමේන්තුව වඩාත් බලවත් ආයතනය බවට පත්වීම
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

19. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉදිරිපත් වූ නවාංග වන්නේ
A - හදිසි අවස්ථා ප්‍රකාශනය සඳහා දින දහයක් තුළදී පාර්ලිමේන්තු අනුමැතිය අවශ්‍යවීම
B - පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය පිහිටුවීම
C - මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ජනතා පරමාධිපත්‍යයේ මූලිකාංග වශයෙන් පිළිගැනීම
D - ජනාධිපතිවරයාගේ නියෝගය මත ජනමත විචාරණ පැවැත්වීම
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

20. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ව්‍යවස්ථාවෙන් ලබා ගත් කාරණා වන්නේ
A - විධායක බලය මධ්‍යගත කිරීම
B - ජීවිතය පිළිබඳ අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම
C - ඒකීය රාජ්‍ය මූලධර්මය
D - නීති පිළිබඳ අධිකරණ පූර්ව විචරණ සිදු කිරීම
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

- අංක **21** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ හතරෙන් ප්‍රකාශ තුනක් ප්‍රශ්නයේ මාතෘකාවට අදළ නොවේ. අදළ **නොවන** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

21. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය
A - ජනතාවගේ පරමාධිපත්‍යය ශක්තිමත් කර තිබේ.
B - මූලික අයිතිවාසිකම් නඩු ආරම්භ කිරීම අභියාචනාධිකරණයෙන් සිදු කළ යුතු බව ප්‍රකාශ කරයි.
C - පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයෙන් සංශෝධනය කළ හැකිය.
D - ශ්‍රී ලංකාවට නැවත පැමිණීමට ඇති අයිතිය පුද්ගල අයිතිවාසිකමක් වශයෙන් පිළිගනී.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

22. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණය
A - උසස් අධිකරණ සහ මහාධිකරණ වශයෙන් වර්ග කොට ඇත.
B - අධිකරණ අමාත්‍යවරයා විසින් අධීක්ෂණය කරනු ලැබේ.
C - අවසාන අභියාචනාධිකරණය ලෙස සලකන්නේ අභියාචනාධිකරණයයි.
D - ආණ්ඩුවේ තුන්වැනි ආයතනයේ තත්ත්වයට ඉහළ නංවා ඇත.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

63647

23. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය
A - ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ බලය දරයි.
B - අභියාචනාධිකරණයට යටත් ය.
C - පළාත් අගනුවරවල් වලදී සැසිවාර පවත්වයි.
D - ජනාධිපතිවරයා පහ කිරීමේ බලය හිමිකෙරගෙන සිටී.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

24. ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය
A - දේශපාලන පක්ෂවලට ජාතික ලැයිස්තුවෙන් ප්‍රසාද ආසනයක් ලබා දෙයි.
B - සරල බහුතර ක්‍රමයට අයත් සමහර ලක්ෂණ සහිත ය.
C - දේශපාලන පක්ෂ නායකයින්ගේ බලය දුර්වල කොට ඇත.
D - පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සහ ඡන්දදායකයා අතර සම්බන්ධය ශක්තිමත් කොට ඇත.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

25. ශ්‍රී ලංකාවේ පළාත් සභා
A - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආවෘත ලැයිස්තුවේ සඳහන් විෂයයන් හිමි කර ගෙන සිටී.
B - පළාත් පාලන ආයතන අධීක්ෂණය කරයි.
C - ඒවාට පවරා ඇති විෂයයන්ට අදාළ ජාතික ප්‍රතිපත්ති සංශෝධනය කිරීමේ බලය හිමිකරගෙන සිටී.
D - පළාත් විධායකයේ නායකයා වශයෙන් එක් එක් පළාතකට ආණ්ඩුකාරවරුන් පත් කරයි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

- අංක **26** සිට **30** දක්වා ඇති ප්‍රකාශවලින් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ වන්නේ ප්‍රකාශ තුනක් පමණි. අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

26. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය
A - මුල්‍ය සම්පත් සඳහා මධ්‍ය ආණ්ඩුව මත රැඳීසිටියි.
B - ප්‍රාදේශීය සභා සහ පළාත් සභාවලින් සමන්විත වෙයි.
C - පළාත් සභා පළාත් පාලන ඇමතිවරයා විසින් අධීක්ෂණය කරනු ලබයි.
D - තමන්ගේ මැතිවරණ පැවැත්වීම සඳහා මධ්‍යම ආණ්ඩුව මත රැඳී පවතියි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

27. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාවේ සාමාජිකයන්
A - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම දරයි.
B - සතු සේවක මණ්ඩල පරිපාලන කටයුතු රාජ්‍ය සේවා කොමිසම භාරයේ පවතියි.
C - විධායක නායකත්වය නඩු පැවරීමට යටත් නොමැති නිසා අධිකරණයේ දී උත්තර දීමට බැඳී නැත.
D - භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමිසන් සභාවේ උපදෙස් ලබා ගනී.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

28. වර්තමාන අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අග්‍රාමාත්‍යවරයා
A - කැබිනට් මණ්ඩලයේ නායකයාගේ භූමිකාව පමණක් රඟපායි.
B - අමාත්‍යවරුන්ට විෂයන් පැවරීම සම්බන්ධයෙන් පවා කිසිදු බලයක් හිමිකරගෙන නැත.
C - ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන කැබිනට් මණ්ඩලයේ හුදු සාමාජිකයකු පමණකි.
D - ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇතිතාක් කල් ධුරය දරයි.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

29. කැබිනට් මණ්ඩලය
A - අවශ්‍ය නම් අගමැතිවරයාද විමසා ජනාධිපති විසින් පත්කරනු ලබයි.
B - සහභැගිරීමේ ආණ්ඩුවක් පවත්නා විටක ජනාධිපතිවරයා විසින් මුලසුන දරනු ඇත.
C - හදිසි අවස්ථාව පැනවීමේදී ජනාධිපතිවරයාට උපදෙස් දීමේ වගකීම හිමිකරගෙන සිටී.
D - අගමැතිවරයා ඉල්ලා අස්වූවිට හෝ ඉවත්කළ විට යළිත් පත් කළ යුතු ය.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

30. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට
A - තුනෙන් දෙකක බහුතරයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි පනත් සම්මත කළ හැකි ය.
B - අතීතයට බලපාන පරිදි නීති පැනවීමට හැකි ය.
C - ඡන්දයෙන් පත් කළ හා පත් නොකළ යන දෙවර්ගයට ම අයත් මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත ය.
D - විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීම මගින් ජනාධිපති බලයෙන් පහකළ හැකිය.
(1) ABC (2) BCD (3) ACD (4) ABD (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

● අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) යන කවර හැඳින්වීම දැ'යි සඳහන් කරන්න.

**අංක 1 වගුව සඳහා යොමුව**

| අංකය | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| (1) | සත්‍ය ය. | සත්‍ය ය. |
| (2) | සත්‍ය ය. | අසත්‍ය ය. |
| (3) | අසත්‍ය ය. | සත්‍ය ය. |
| (4) | අසත්‍ය ය. | අසත්‍ය ය. |

**වගුව 1**

| | ප්‍රකාශය I | ප්‍රකාශය II |
|---|---|---|
| 31. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ පිළිගෙන ඇත. | තමන් මැතිවරණයට තරඟ කොට ජයගත් පක්ෂය විසින් පක්ෂයෙන් පහ කළ විට පාර්ලිමේන්තු මන්ත්‍රී සිය අසුන අහිමි කර ගනියි. (.........) |
| 32. | මහා මැතිවරණයකදී නාමයෝජනා ලැයිස්තු භාරදුන් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ශ්‍රී ලංකාවේ ඡන්දදායකයින් සිය ඡන්දය පාවිච්චි කරති. | දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දුන් ඡන්දදායකයන් විසින් ලබාදෙන ලද මනාප පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තෝරා පත්කරගනු ලැබේ. (.........) |
| 33. | අග්‍රාමාත්‍යවරයා විසින් නායකත්වය දරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 17 වන සංශෝධනය මගින් නිර්මාණය කරන ලදී. | ජනාධිපති විසින් මැතිවරණ කොමිෂමට පත් කළ යුතු සාමාජිකයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් නම් කළ යුතු ය. (.........) |
| 34. | රාජ්‍යයේ ආයතනවලින් දේශපාලනය ඉවත්කිරීම 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් අපේක්ෂා කරන ලදී. | රාජ්‍ය සම්පත්වල භාරකරුවා වන රාජ්‍ය සේවාව එබඳු එක් රාජ්‍ය ආයතනයකි. (.........) |
| 35. | 1945 දී අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලදී. | ලෝක සාමය ආරක්ෂා කරගැනීමේ අරමුණින් දෙවැනි ලෝක යුද්ධයට පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලදී. (.........) |
| 36. | එක්සත් ජාතීන් විසින් පවත්වාගෙන යනු ලබන ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය, පුද්ගලයා සහ රාජ්‍ය අතර සම්බන්ධතාවය පිළිබඳව අවධානය යොමු කරයි. | රාජ්‍යයන්ගේ සංවිධානය වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය ක්‍රියාවට නැංවීමේ වගකීම භාරගෙන සිටියි. (.........) |
| 37. | නිදහස ලබා ගැනීමෙන් පසුව ද පෙර පැවති යටත් විජිත එක්ව තබා ගැනීම බ්‍රිතාන්‍ය පොදුරාජ්‍ය මණ්ඩලය පිහිටුවීමේ එක් අරමුණකි. | අද පොදුරාජ්‍ය මණ්ඩලය තම සාමාජික රටවල් අතර ආර්ථික හා සංස්කෘතික සහයෝගිතාවය උදෙසා වූ සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වෙයි. (.........) |
| 38. | මෑත වර්ෂවලදී බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලය තම සාමාජික රාජ්‍යයන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන අවශ්‍යතාවයන් ගැනද අවධානය යොමු කොට ඇත. | සාමාජික රාජ්‍යයන්ගේ රාජ්‍ය හෝ ආණ්ඩු නායකයන් හා බ්‍රිතාන්‍ය මහ රැජින පොදුරාජ්‍ය මණ්ඩල ප්‍රධාන සමුළුවට සහභාගි වෙයි. (.........) |
| 39. | කලාපීය සහයෝගිතාව උදෙසා වූ දකුණු ආසියානු සංවිධානය (SAARC) පිහිටුවනු ලැබුයේ සාමාජික රාජ්‍යයන්ගේ ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය කිරීමට ය. | සාර්ක් රටවල් මුහුණදෙන එක් බාධකයක් වන්නේ ඉන්දු-පකිස්තාන ගැටුම ය. (.........) |
| 40. | සාර්ක් විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන අරමුණක් වන්නේ ඉන්දු-චීන සම්බන්ධතා වැඩිදියුණු කිරීම ය. | සාර්ක් සංවිධානය ක්‍රීඩා, අධ්‍යාපන හා සංස්කෘතික ක්ෂේත්‍රවල කිසියම් ආකාරයක සාර්ථකත්වයක් පෙන්වා ඇත. (.........) |

* *

63639



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

23 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

දේශපාලන විද්‍යාවේ මූලිකාංග II (II කොටස)
அரசியல் மூலத்துவங்கள் II (பகுதி II)
Elements of Political Science II (Part II)

**අයදුම්කරුවන්ට උපදෙස් :**

* ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **15**කි.
* ප්‍රශ්න කොටස්වලට බෙදී ඇති විට ලකුණු කොටස් අතර සමාන ව බෙදේ.

1. පහත සඳහන් මාතෘකා යටතේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය පිළිබඳ ව විමසන්න.
   (i) නායකත්වය සහ සමාජ පසුබිම
   (ii) 1919 දී එකතුවූ අරමුණු සහ ක්‍රියාකාරී වැඩසටහන
   (iii) සිංහල සහ දෙමළ නායකයන් අතර ඇති වූ මතභේදය

2. ශ්‍රී ලාංකික නායකයන්ට ලබා දුන් අර්ධ වගකීම් හා සම්බන්ධ කරමින් ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකරුගේ භූමිකාව විමසන්න.

3. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ඒවා විමසන්න.
   (i) දෙවැනි මණ්ඩලය
   (ii) අග්‍රාණ්ඩුකාරවරයා
   (iii) අගමැති හා කැබිනට් මණ්ඩලය

4. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති කැබිනට් මණ්ඩලය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැබිනට් මණ්ඩලය සමග පහත සඳහන් මාතෘකා යටතේ සසඳන්න.
   (i) පත්කිරීමේ ක්‍රමය
   (ii) ඉවත් කිරීමේ ක්‍රමය
   (iii) ජනාධිපති සමග ඇති සම්බන්ධතාවය

5. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම උදෙසා වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සපයා ඇති විධිවිධානයන් විමසන්න.

6. පහත සඳහන් මාතෘකා යටතේ වර්තමාන පාර්ලිමේන්තුව පිළිබඳ ව විමසන්න.
   (i) සංයුතිය
   (ii) ව්‍යවස්ථාදායක බලය
   (iii) විසුරුවා හැරීම හා වාර අවසාන කිරීම

7. පහත දැක්වෙන ඕනෑ ම මාතෘකා **තුනක්** ගැන කෙටි සටහන් ලියන්න.
   (i) කෝල්බෲක්-කැමරන් නිර්දේශ
   (ii) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය
   (iii) වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණය
   (iv) වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම්
   (v) වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා ව ඉවත් කිරීම

* * *